**කාර්යක්ෂමතා කඩඉම් විභාග**

**අයදුම්පත් මාර්ගගතව සම්පූර්ණ කිරීම සඳහා පොදු උපදෙස්**

**(අ) පොදු උපදෙස්:**

1. මාර්ගගත (online) අයදුම්පත **ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක්** සම්පූර්ණ කළ යුතු අතර, මෙම උපදෙස් පත්‍රිකාව අවසානයේ ඇති **ඇමුණුමේ ආකෘතිය** අනුව සම්පූර්ණ කළ යුතුය.
2. අයදුම්කරු විසින් මාර්ගගත අයදුම්පතේ ඇතුළත් කරනු ලබන ජංගම දුරකථන අංකය වෙත විභාගය සම්බන්ධව සිදුකරනු ලබන සියලුම දැනුම්දීම් SMS මඟින් එවනු ලබන බැවින්, අයදුම්කරු වෙත එම තොරතුරු ලබා ගත හැකි ජංගම දුරකථන අංකයක් යෙදිය යුතු වේ.
3. **එක් අයදුම්කරුවකු හට එවිය හැකි වන්නේ එක් අයදුම්පතක් පමණි.** මාර්ගගත පද්ධතියට ප්‍රවේශවීම (Login) සඳහා ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදිව ඇතුළත් කරන්න. අන් අයගේ ජාතික හැඳුනුම්පත් අංක ඇතුළත් කිරීමෙන් වළකින්න.
4. අයදුම්පත පිරවීමේදී විශේෂිත අක්ෂර (Special Characters) වන “ ” ?: { }[ ]’!`~#$%^* <> = + - _ | නොයෙදිය යුතුය. එවැනි විශේෂිත අක්ෂර යොදා සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අර්ධ වශයෙන් යොමු වීම හෝ ප්‍රතික්ෂේප වීම මත සිදුවන අපහසුතා අයදුම්කරු විසින් දරාගත යුතු වේ.
5. විභාග ගාස්තු ගෙවීමේදී පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.
   i. බැංකු ණය කාඩ්පතක් මඟින් (Bank Credit Card)
   ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සක්‍රීය කර ඇති බැංකු හර කාඩ්පතක් මඟින් (Bank Debit Card with internet payment facility)
   iii. ලංකා බැංකු “B app” ජංගම දුරකථන යෙදවුම මඟින් (Bank of Ceylon “B app” Mobile Application)
   iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Bank of Ceylon branch)

   (ලංකා බැංකු ශාඛාවක් මඟින් හෝ ''B App''”යෙදවුම මඟින් ගෙවීම සිදු කිරීමට අදාළව ඔබට අනන්‍යව E***** ලෙස ලැබෙන යොමු අංකය (Reference No.) අනිවාර්යයෙන් යෙදිය යුතුය.)
6. ඉහත ක්‍රම මඟින් ගෙවීම් කරනු ලබන ආකාරය සඳහා (ආ) **තාක්ෂණික උපදෙස්** බලන්න. **අයදුම්කරුවන් හට මුදල් ගෙවීමේ ක්‍රමවේද (Payment Method) වෙනස් කළ හැක්කේ එක් වරක් පමණි.**
7. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් වගකියනු නොලබන අතර, විභාග ගාස්තු ආපසු ගෙවීම (Refund) හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ කරනු නොලැබේ.
8. **සම්පූර්ණ කරන ලද තොරතුරු නිවැරදිව හා දී ඇති උපදෙස් පරිදි සම්පූර්ණ කර තිබේ දැයි පරීක්ෂා කර තහවුරු කරගන්න. (පොදු උපදෙස් හා තාක්ෂණික උපදෙස් පරිදි)** අයදුම්පතේ දත්ත, මාර්ගගත පද්ධතියට ඇතුළත් කිරීමට පෙර, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවන ලද නීති රීතිවලට එකඟ වන බව තහවුරු කළ යුතුය.

9. **ඉන් පසු "Submit this application" හා "Proceed to payment" click කර, මුදල් ගෙවා "Complete and Submit" click කර අයදුම්පත මාර්ගගතව යොමු කළ යුතුය.**

10. අදාළ විභාගයට මුදල් ගෙවා අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු, එය බාගත කර (download), මුද්‍රිත පිටපතක් (printout) ලබාගෙන අත්සන සහතික කිරීමෙන් අනතුරුව **ලියාපදිංචි තැපෑලෙන් "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට එවිය යුතුය. පසුව කරනු ලබන විමසීම් සඳහා එහි පිටපතක් ළඟ තබාගත යුතුය.**

11. මාර්ගගත අයදුම්පත් සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්වේ.
    a. අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සහිත මාර්ගගත අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
    b. මුදල් නොගෙවන ලද අයදුම්පත් (පළමුවන වරට අයදුම්කරන නිලධාරීන් හැර) ප්‍රතික්ෂේප කරනු ලැබේ.

    අයදුම්පතේ මුද්‍රිත පිටපතේ අදාළ අත්සන් යොදා ලියාපදිංචි තැපැල මඟින් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර, විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු වේ. කවරයේ වම්පස ඉහළ තමා අයදුම්කරන විභාගයේ නම නිවැරදිව සටහන් කළ යුතුය. එසේ මුද්‍රිත පිටපත සම්පූර්ණ කර නොඑවුවහොත් මාර්ගගත අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. තැපැල මඟින් එවනු ලබන අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් වගකියනු නොලැබේ.

13. විමසීම් කිරීම - කාර්යාලීය වේලාවන් **තුළදී පමණි.**
    - විභාගයට අදාළ කරුණු පිළිබඳව - ගැසට් පත්‍රයේ/ විභාග නිවේදනයේ සඳහන් වන අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව මඟින්
    - විභාග අයදුම්පත් යොමු කිරීමේදී ඇතිවන තාක්ෂණික ගැටලු පිළිබඳව - 011-2785230, 011-3661244
    - ලංකා බැංකු ශාඛා මඟින් ගෙවීම් පිළිබඳව - 011- 2205280

14. අයදුම්පත් මාර්ගගතව යොමු කළ පසු එහි සඳහන් වන තොරතුරු කිසිදු හේතුවක් මත පසුව වෙනස් කරනු නොලැබේ. එබැවින් අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ පූර්ණ වගකීම වේ.

15. අයදුම්පතේ මුද්‍රිත පිටපතේ සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ.

16. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මෘදු පිටපතේ (Soft copy) සඳහන් තොරතුරු නිවැරදි තොරතුරු බවට සලකා ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.


**(ආ) තාක්ෂණික උපදෙස්:**

1. **පද්ධතියට ප්‍රවේශ වීම**

   i. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට ප්‍රවේශ වන්න (www.doenets.lk).


   ii. එහි අපගේ සේවා (Our Services) යටතේ ඇති "**Online Applications (EB/Recruitment Exams)** " මුහුණත (Tile) මත Click කරන්න.

   iii. ඉන්පසු ඔබට පහත දිස්වන වෙබ් පිටුවට ප්‍රවේශ විය හැක.




   iv. එහි ඇති "**Apply for Exams**" මඟින් අදාළ විභාගය වෙත ප්‍රවේශ විය හැක.

2. “Apply for Exams”





i. අයදුම් කළ හැකි විභාග සම්බන්ධ තොරතුරු ඉහත කවුළුවෙන් දිස්වේ.


ii. යම් අවස්ථාවන්හිදී එකම ආයතනයක් විසින් අයදුම්පත් කැඳවනු ලබන විභාග කිහිපයක් තිබිය හැකි බැවින්, අයදුම්පත් යොමු කිරීමට බලාපොරොත්තුවන විභාගය අවධානයෙන් යුතුව තෝරා ගත යුතු වේ. අයදුම් කිරීමෙන් පසුව විභාග මාරු කිරීම සිදුකළ නොහැක.

iii. එහිදී විභාගය සම්බන්ධ ගැසට්/විභාග නිවේදනය හා උපදෙස් පත්‍රිකාව බාගත කළ හැක.

➢ **Apply** - පළමුව ඔබට ප්‍රවේශ වීමේ කවුළුවක් (Login Window) දර්ශනය වන අතර **එහි ඔබේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම අනිවාර්ය වේ.** එයට අමතරව තම ජංගම දුරකථන අංකය හෝ ඊ-මේල් ලිපිනය හෝ ඒ දෙකම හෝ ඇතුළත් කර “**I Agree with the Terms and Conditions**” “√” කර **reCAPTCHA** “√” කර “**Next**” Click කරන්න.



➢ ඔබට පහත කවුළුව (Verify OTP Window) දිස්වේ. ඔබගේ ජංගම දුරකථන අංකයට (SMS මඟින්) හෝ ඊ-මේල් ලිපිනයට ලැබී ඇති **OTP verification code** ඇතුළත් කර "**Submit**" click කරන්න.




3. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් පසු

අයදුම්කරු අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට වම්පස පහත රූපයේ දිස්වන පරිදි button දෙකක් දක්නට ලැබේ.




- "**Save**" - මෙය click කිරීමෙන් ඔබට අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාව තෙක් ඔබගේ තොරතුරු පිරවිය හැකි වේ.
- අයදුම්පතේ සියලු තොරතුරු ඇතුළත් කළ පසු ඉදිරියට යාමට "Submit this application" click කළ යුතුය.
- ඔබ විසින් "**Submit this application**" click කිරීම සහ ඉන්පසු සිදුකළ යුතු ඉදිරි ක්‍රියාවලිය සිදු නොකරන්නේ නම්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාවෙන් පසුව ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප වේ.

- "**Submit this application**" click කළ පසු ඔබ විසින් ඇතුළත් කරන ලද තොරතුරු පහත රූපයේ පරිදි දිස්වේ (preview).

Personal Information

| | |
|---|---|
| Select the relevant title | -- |
| Name in Full (IN BLOCK CAPITAL LETTERS) | HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA |
| Postal Address (IN BLOCK CAPITAL LETTERS) | 254/2, PELAWATTA, BATTARAMULLA. |
| Contact Number (Mobile)(For the future communication through SMS) | 0712874125 |
| Contact Number (Residence) | 0112478452 |
| Email Address | test@gmail.com |
| Gender | Male |
| Date of Birth | 02 Jun 1992 |
| Are you a citizen of Sri Lanka? | Yes |

Educational Qualifications (English Language)

| | |
|---|---|
| Do you possess a Credit pass in English Language at the G.C.E. (O/L) or N.C.G.E. or S.S.C. or international GCSE Examination? | Yes |
| Grade obtained | C |
| Name of the examination | G.C.E.(O/L) Examination |
| Name of the Dept./ Institution | Department of Examinations |
| Year | 2003 |

- යම් හෙයකින් ඔබගේ තොරතුරු නැවත සංශෝධනය (Edit) කළ යුතු නම්, Edit and Submit මගින් නැවත අයදුම්පත වෙත ගොස් ( ← ) , සංශෝධනය (Edit) කර, "Submit this application" click කිරීමෙන් ඉදිරියට යා හැකිය.

- ඇතුළත් කරන ලද තොරතුරු නිවැරදි නම් පහත රූපයේ පරිදි එකඟතාව පළකිරීමෙන් ඉදිරියට යා හැකිය.

Certification of the Applicant

Attestation of Signature

Certificate of the Head of the Department

☑ I hereby confirm that the information provided here is accurate, correct and complete.


Only the first time candidates should click on "First time (Toll free)" below. All other applicants should click on "Pay for Subjects".

First time (Toll free) | Pay for Subjects

* Payment for the subjects should be made as per the gazette notification.

ගැසට් නිවේදනයේ සඳහන් පරිදි ඔබ විභාගයට අයදුම් කරන්නේ ප්‍රථම වතාවට නම් " First Time (Toll Free)" click කර ඉදිරියට ගොස් අයදුම්පත බාගත කර මුද්‍රණය කරගන්න.

ඔබ විභාගයට අයදුම් කරන්නේ ප්‍රථම වතාවට නොවේ නම් " Pay for Subjects" click කරන්න. එවිට පහත පරිදි තිරයක් දිස්වේ.





මෙහිදී ඔබට අනිවාර්යයෙන්ම ගැසට් නිවේදනයේ සඳහන් පරිදි ඔබ විභාගයට පෙනී සිටින විෂයයන් සංඛ්‍යාව "**Enter the number of subjects to be paid in this box**" යනුවෙන් සඳහන් කොටුව තුළ ඇතුළත් කරන්න. ඇතුළත් කළ විෂයයන් සංඛ්‍යාව නිවැරදි නම් ඉහත රූපයේ පරිදි √ ලකුණ යොදා එකඟතාව පළ කර "**Proceed to payments**" click කිරීමෙන් මාර්ගගතව විභාග අයදුම්පත් සඳහා මුදල් ගෙවීමේ පිටුවට යොමු වේ.

2. **විභාග ගාස්තු ගෙවීම**

**සැ.යු. අයදුම්කරුවන් හට විභාග ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය (Payment Method) වෙනස් කිරීමට හැකියාව ලබාදී ඇත්තේ එක්වරක් පමණි.**


පහත රූපයේ පෙන්වා ඇති පරිදි ඔබ විසින් විභාග ගාස්තු ගෙවීමට බලාපොරොත්තු වන ක්‍රමවේදය තෝරන්න.




➢ **Pay with Credit/Debit Card** ක්‍රමවේදය

- මේ සඳහා සේවා ගාස්තු වශයෙන් විභාග ගාස්තුවෙන් 1.7% ක මුදලක් අයකරනු ලබයි.

- ඉහත ක්‍රමවේදයෙන් ගෙවීම් කිරීම සඳහා ඔබගේ **Credit/Debit** කාඩ්පත අන්තර්ජාල ගෙවීම් පහසුකම සක්‍රිය කර ඇති බැංකු **Credit/Debit** කාඩ්පතක් විය යුතුය.
- එසේ නොවන බැංකු **Credit/Debit** කාඩ්පත් මගින් ගෙවීම් කළ නොහැකිවන අතර ඔබගේ ගෙවීම ප්‍රතික්ෂේප වේ.





➢ **Pay with BOC** ක්‍රමවේදය

“**Pay with BOC**” මගින් මුදල් ගෙවීමේදී පහත පරිදි ඔබට යොමු අංකයක් (Reference Number) ලැබේ. එය රැගෙන **ඕනෑම ලංකා බැංකු ශාඛාවක් වෙත ගොස් හෝ ලංකා බැංකු ඔන්ලයින් බැංකින් ක්‍රමවේදයෙන් (B App මගින්)** හෝ මුදල් ගෙවීම් සිදුකර නැවත මාර්ගගත පද්ධතියට පිවිසිය යුතුය.


**විභාග දෙපාර්තමේන්තු ගිණුම් අංකයට සෘජුවම Slip මගින් ගෙවීම් නොකළ යුතුය.**

නැවත මාර්ගගත පද්ධතියට පිවිසීම සඳහා පද්ධතියට ප්‍රවේශ වන (**Our Services**) යටතේ ඇති “**Online Applications (Recruitment Exams)**” මුහුණත (Tile) මත Click කර හෝ https://applications.doenets.lk වෙත පිවිස එහි “**Continue after payment**” Click කරන්න. ඉන්පසු ඔබේ යොමු අංකය (Reference Number) ඇතුළත් කර ඉදිරියට යන්න.


සැ.යු: **“Pay with BOC” මගින් ගෙවීම් කිරීමේදී ලංකා බැංකුව විසින් සේවා ගාස්තු වශයෙන් එක් අයදුම්පතක් සඳහා රු. 20.00 ක මුදලක් අයකරනු ලබයි.**




- ➢ මුදල් ගෙවූ පසු නැවත මාර්ගගත පද්ධතියට පිවිස එහි ඇති **"Continue after Payment"** click කරන්න.




- ➢ ඉන්පසු පහත රූපයේ පරිදි ඔබගේ යොමු අංකය (**Reference Number**) පද්ධතියට ඇතුළත් කර ඉදිරියට යන්න.





- ➢ ඉහත ක්‍රම මගින් මුදල් ගෙවූ පසු, මුදල් ගෙවූ බවට අදාළ ලදුපත ප්‍රදර්ශනය වන අතර, එය මුද්‍රණය කර ගත හැක. එසේම මෙම තොරතුර ඔබගේ ජංගම දුරකථන අංකයට (SMS මගින්) හෝ ඊමේල් ලිපිනයට ද යැවේ.




3. **අයදුම්පත මාර්ගගතව යොමු කිරීම**


මුදල් ගෙවූ පසු අයදුම්පත මාර්ගගතව යොමු කිරීම සඳහා පහත රූපයේ පරිදි විභාග දෙපාර්තමේන්තු කොන්දේසිවලට (**Terms and Conditions**) එකඟ වන බවට හා අයදුම්පත යොමු කිරීම තහවුරු කිරීම (**Confirm**) සිදුකළ යුතුය. ඉන්පසු “**Complete & Submit**” click කරන්න.




4. **අයදුම්පත බාගත කිරීම (Download) හා මුද්‍රිත පිටපත (Printout) ලබා ගැනීම**

පහත රූපයේ පරිදි “**Download my application**” click කිරීමෙන් ඔබගේ අයදුම්පත බාගත කළ හැක. බාගත කළ පසු එහි මුද්‍රිත පිටපතක් ලබාගන්න. එම මුද්‍රිත පිටපතෙහි මාර්ගගතව පුරවන ලද තොරතුරුහි කිසිදු සංශෝධනයක් (Edit) සිදු නොකළ යුතුය.

අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතේ අයදුම්කරුගේ අත්සන සහතික කර ආයතන ප්‍රධානිගේ සහතිකය සමඟ “ විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල” වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා අයදුම්කරන විභාගයේ නම නිවැරදිව සඳහන් කළ යුතුය.




5. **මාර්ගගත අයදුම්පත ලද බව දැන්වීම**

අයදුම්පත් භාර ගැනීම අවසන් වූ පසු අයදුම්පත දෙපාර්තමේන්තු පද්ධතිය මඟින් තහවුරු කළ පසු අයදුම්පත ලද බව SMS මඟින් අයදුම්කරුට දැනුම් දෙනු ලැබේ.

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016(2025)**

**මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා විශේෂ උපදෙස්**

පහත අයිතමයන් සම්පූර්ණ කිරීමේදී දක්වා ඇති උපදෙස් පිළිපදින්න.

i. සම්පූර්ණ කළ යුතු මාර්ගගත අයදුම්පතේ ඇති අයිතමයන්හි * සලකුණ යොදා ඇති සෑම අයිතමයක්ම ඔබ විසින් අනිවාර්යයෙන් පිරවිය යුතු වේ.

විභාගයට පෙනී සිටින මාධ්‍යය සඳහන් කරන්න.

## Medium

* Language Medium of Examination

○ Sinhala ○ Tamil ◉ English

ii. පෞද්ගලික තොරතුරු අදාළ පරිදි ඇතුළත් කරන්න.

## Personal Information

* Name in Full (IN BLOCK CAPITAL LETTERS)

HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA

(E.g. : GUNAWARDHANA MAHESH GAYASHAN BANDARA SAMAN KUMARA) Max Length : 90

* Name with Initials (IN BLOCK CAPITAL LETTERS)

GUNAWARDHANA, H.M.S.K.

(E.g. : GUNAWARDHANA, M.G.B.S.K) Max Length : 90

Official Address

* Address (IN BLOCK CAPITAL LETTERS)

254/2,PELAWATTA

(E.g: 254/2,PELAWATTA) Max Length : 120

* Postal Town (IN BLOCK CAPITAL LETTERS)

BATTARAMULLA

(E.g: BATTARAMULLA) Max Length : 30

Private Address

* Address (IN BLOCK CAPITAL LETTERS)

254/2,PELAWATTA

(E.g: 254/2,PELAWATTA) Max Length : 120

* Postal Town (IN BLOCK CAPITAL LETTERS)

BATTARAMULLA

(E.g: BATTARAMULLA) Max Length : 30

* Mobile No

4444444444

Max Length : 10

* Landline No

4444444444

Max Length : 10

* Gender

Male

* Date of Birth

11/18/1993

* Subject / subjects that you appear in this examination

- [x] 01-Basic Statisitcal Methods
- [x] 02-Office Administration and Establishment Code
- [x] 03-Financial Regulations

iii. සේවා තොරතුරු හා අදාළ විෂයයන් නිසි පරිදි ඇතුළත් කරන්න.

## Other

* Current Post

Statistical Officer

* Number of the appointment letter

CS/ADMIN/02/SO

* Are you sitting the examination for the first time

YES

iv. මුද්‍රිත පිටපත ලබා ගැනීමෙන් පසු අනු අංක (iv) හි අත්සන හා දිනය සහ අනු අංක (v) තොරතුරු අත් අකුරින් පිරවිය යුතුය.

* අයදුම්කරුගේ ප්‍රකාශය (Applicant's Statement)
* මුද්‍රිත පිටපතෙහි අදාළ ස්ථානයේ අයදුම්කරු විසින් තම අත්සන යෙදිය යුතුයි.

(Please print the application form and fill the following details by hand.)

## (4). Declaration of the Candidate

I declare that the above particulars are true & correct to the best of my knowledge and that I am eligible to appear for the examination, in the language medium indicated above and I am sitting for the examination for the first time/ I have paid the relevant examination fee. Further, I agree to abide by the rules and regulations imposed by the Commissioner General of Examination regarding the conduct of this examination and issuing results.

Date : ..........................................................................................

Signature of the candidate : ......................................................................

## (5). Attestation of the signature

I, hereby certify that Mr./Mrs./Miss ................................................who serves at my Department is personally known to me and that he/ she placed his / her signature in my presence on ......................................

Signature of the officer attesting the signature : ............................................................................

Name : ................................................................

Designation : ................................................................



Address : ............................................................

Date : ..................................................................

(Certify by the official frank)

vi. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

(6). Certificate of the Head of the Department

I certify that, 1. The particulars furnished by the above officer have been checked. 2. He/she is eligible to sit for the examination.

Signature of Head of Department : ..........................................................................................

Name : ......................................................................

Designation : ......................................................................

Address : .........................................................................

Date : ................................................................

(Official stamp)

---

මුද්‍රිත පිටපතෙහි අදාළ ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තම අත්සන සහ නිල මුද්‍රාව යෙදිය යුතුයි.

සැ.යු. අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර **"ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල."** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

* මුද්‍රිත පිටපත ලබා ගත් පසු ගෙවීම් සම්බන්ධ තොරතුරු පහත පරිදි දිස් වේ.

| *Official use only* | |
|---|---|
| **Payment Information** | |
| NIC | 111111111111 |
| Application Reference | EBY4VK |
| Payment Date and Time | 01-01-1970 05:30:00 |
| Exam Applied | FIRST EFFICIENCY BAR EXAMINATION FOR GRADE II STATISTICAL OFFICERS IN THE DEPARTMENT OF CENSUS AND STATISTICS -2016 (2025) |
| Exam Fee | 0.00 LKR |
| Total fee Paid | 0.00 LKR |